# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2306/02 - 2022 නොවැම්බර් මස 14 වැනි සඳුදා - 2022.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/1951 (XIV)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 8 වන, 10 වන, 14 වන, 15 වන, 18 වන, 19අ වන, 30 වන, 37 වන, 42 වන, 139ඈ වන, 139ඌ වන, 195 වන සහ 231 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2022 අංක 04 දරන මෝටර් වාහන (ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2022 නොවැම්බර් මස 18 වන දින සිට බලාත්මක විය යුතු ය.

2. 3 වන නියෝගයේ විධිවිධානවලට යටත්ව -

(අ) විදේශයක ලියාපදිංචි ප්‍රධාන නිෂ්පාදකයකු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු විසින් නිෂ්පාදනය කරන ලදුව හෝ එකලස් කරන ලදුව හෝ නිෂ්පාදනය කර සහ එකලස් කරන ලදුව, ඉන් අනතුරුව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද;

1A - PG 6036 — 506 (2022/11)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ එකඟත්වය ඇතිව, කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය සමඟ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ තත්කාර්යය සඳහා ලියාපදිංචි වූ කර්මාන්තයක් විසින් දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද හෝ නිෂ්පාදනය කර සහ එකලස් කරන ලද; හෝ

(ඇ) (ආ) ඡේදයේ සඳහන් යම් දේශීය කර්මාන්තයක් විසින් නිෂ්පාදනය කරනු ලැබූ නව කොටස් සහ වැසි භාවිත කරමින් දේශීය වශයෙන් නිර්මාණය කරන ලද, නිෂ්පාදනය කරන ලද සහ එකලස් කරන ලද,

මෝටර් වාහනයක් වූ ද, මේ නියෝගවල I වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන වර්ගයකට අයත් වන මෝටර් වාහනයක් වූ ද, මෝටර් වාහනයක් පළමුවර ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

3. (1) 2 වන නියෝගයේ සඳහන් මෝටර් වාහනයක් පළමුවරට ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක්-

(අ) එම මෝටර් වාහනය ආනයනය කළ දින සිට;

(ආ) (අදාළ වේ නම්) එම මෝටර් වාහනය සඳහා වන තීරු බද්ද ගෙවූ දින සිට හෝ අවස්ථාවෝචිත පරිදි, දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද හෝ නිෂ්පාදනය කර සහ එකලස් කරන ලද මෝටර් වාහනය මිල දී ගත් දින සිට; හෝ

(ඇ) රජයට හෝ අර්ධ රාජ්‍ය සංවිධානයකට හෝ ශ්‍රී ලංකා රේගුවට අයත් ලියාපදිංචි නොකළ මෝටර් වාහනය වෙන්දේසි කළ දින සිට,

ලිත් දින අනුවක කාලසීමාවක් ඇතුළත ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, 2 වන නියෝගය යටතේ ගෙවිය යුතු ගාස්තුව සමඟ, (2) වන උපනියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි, ප්‍රමාද වීමේ කාලසීමාව අනුව වූ අතිරේක ප්‍රමාද ගාස්තුවක් ද අයකරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගවල II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන වර්ග සඳහා ගෙවිය යුතු අතිරේක ප්‍රමාද ගාස්තුව, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාද වීමේ කාලසීමාව අනුව, ඒ උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

4. (1) යම් තැනැත්තකු මෝටර් වාහනයක තාවකාලික අයිතිකරුවකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව-

(අ) සාමාන්‍ය පදනම මත, රුපියල් දහසක් විය යුතු ය;

(ආ) ප්‍රමුඛතා පදනම මත, රුපියල් දෙදහසක් විය යුතු ය; සහ

(ඇ) එක් දින පදනම මත, රුපියල් තුන්දහසක් විය යුතු ය.

(2) (1) වන උපනියෝගය යටතේ කරන ලද ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව -

(අ) සාමාන්‍ය පදනම මත, රුපියල් දහසක් විය යුතු ය;

(ආ) ප්‍රමුඛතා පදනම මත, රුපියල් දෙදහසක් විය යුතු ය; සහ

(ඇ) එක් දින පදනම මත, රුපියල් තුන්දහසක් විය යුතු ය.

5. 6 වන නියෝගයේ විධිවිධානවලට යටත්ව, මේ නියෝගවල III වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන වර්ග සම්බන්ධයෙන් යම් තැනැත්තකු මෝටර් වාහනයක නව අයිතිකරුවකු ලෙස සාමාන්‍ය, ප්‍රමුඛතා හෝ එක් දින පදනම මත ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව, ඒ උපලේඛනයේ, පිළිවෙළින්, II වන තීරයේ, III වන වන තීරයේ සහ IV වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

6. (1) (අ) මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින්, ස්වේච්ඡාවෙන් සිදු කරන ලද පැවරීමක් මත ඒ මෝටර් වාහනයේ සන්තකය වෙනස් වීමේ දී ඒ මෝටර් වාහනයේ නව අයිතිකරුවකු ලෙස යම් තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක්, එසේ සන්තකය වෙනස් වීමේ දින සිට දින දහහතරක් ඇතුළත ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, 5 වන නියෝගය යටතේ ගෙවිය යුතු ගාස්තුව සමඟ, (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි එම කල් ඉකුත් වූ එක් එක් දිනය සඳහා අතිරේක ප්‍රමාද ගාස්තුවක් ද ගෙවනු ලැබිය යුතු ය.

(ආ) මේ නියෝගවල IV වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන වර්ග සඳහා, කල් ඉකුත් වූ එක් එක් දිනය සඳහා ගෙවිය යුතු අතිරේක ප්‍රමාද ගාස්තුව ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු යː

එසේ වුව ද, මේ උපනියෝගය යටතේ ගෙවිය යුතු උපරිම අතිරේක ප්‍රමාද ගාස්තුව ඒ උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව නොඉක්ම විය යුතු ය.

(2) මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරුගේ මරණය සිදු වීම මත ඒ මෝටර් වාහනයේ සන්තකය වෙනස් වීමේ දී ඒ මෝටර් වාහනයේ නව අයිතිකරුවකු ලෙස යම් තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක්, එසේ සන්තකය වෙනස් වීමේ දින සිට දින එකසිය අසූවක් ඇතුළත ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, 5 වන නියෝගය යටතේ ගෙවිය යුතු ගාස්තුව සමඟ, (1) වන උපනියෝග යේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අතිරේක ප්‍රමාද ගාස්තුවක් ද ගෙවනු ලැබිය යුතු ය.

(3) මෝටර් වාහනයක මියගිය ලියාපදිංචි අයිතිකරුගේ තෙස්තමේන්තු නඩු කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස වූ අධිකරණ නියෝග යක සඳහන් දින සිට දින හැටක් ඇතුළත ඒ මෝටර් වාහනයේ නව අයිතිකරුවකු ලෙස යම් තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, 5 වන නියෝගය යටතේ ගෙවිය යුතු ගාස්තුව සමඟ, (1) වන උපනියෝගයේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අතිරේක ප්‍රමාද ගාස්තුවක් ද ගෙවනු ලැබිය යුතු ය.

(4) රජයට හෝ අර්ධ රාජ්‍ය සංවිධානයකට හෝ ශ්‍රී ලංකා රේගුවට අයත් මෝටර් වාහනයක් විකිණීමෙන් පසුව, එම විකිණීම මත එකී මෝටර් වාහනයේ සන්තකය වෙනස් වීමේ දින සිට දින එකසිය අසූවක් ඇතුළත නව අයිතිකරු ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, 5 වන නියෝගය යටතේ ගෙවිය යුතු ගාස්තුව සමඟ, (1) වන උපනියෝගයේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අතිරේක ප්‍රමාද ගාස්තුවක් ද ගෙවනු ලැබිය යුතු ය.

7. මේ නියෝගවල V වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන වර්ග සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකයක අනුපිටපතක් සාමාන්‍ය පදනම මත නිකුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

8. (1) මෝටර් වාහනයක ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව -

(අ) සාමාන්‍ය පදනම මත, රුපියල් දහසක් විය යුතු ය;

(ආ) ප්‍රමුඛතා පදනම මත, රුපියල් එක් දහස් පන්සියයක් විය යුතු ය; සහ

(ඇ) එක් දින පදනම මත, රුපියල් දෙදහසක් විය යුතු ය.

(2) මෝටර් වාහනයක ලියාපදිංචිය අත්හිටුවීම ඉවත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව -

(අ) සාමාන්‍ය පදනම මත, රුපියල් දහසක් විය යුතු ය;

(ආ) ප්‍රමුඛතා පදනම මත, රුපියල් එක් දහස් පන්සියයක් විය යුතු ය; සහ

(ඇ) එක් දින පදනම මත, රුපියල් දෙදහසක් විය යුතු ය.

9. (අ) යම් තැනැත්තකුගේ නම පරම අයිතිකරු වශයෙන් මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ ලේඛනයට ඇතුළත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව -

(i) සාමාන්‍ය පදනම මත, රුපියල් දෙදහසක් විය යුතු ය;

(ii) ප්‍රමුඛතා පදනම මත, රුපියල් තුන්දහසක් විය යුතු ය; සහ

(iii) එක් දින පදනම මත, රුපියල් හාරදහසක් විය යුතු ය; සහ

(ආ) පරම අයිතිකරුගේ නම මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව-

(i) සාමාන්‍ය පදනම මත, රුපියල් දහසක් විය යුතු ය;

(ii) ප්‍රමුඛතා පදනම මත, රුපියල් එක් දහස් පන්සියයක් විය යුතු ය; සහ

(iii) එක් දින පදනම මත, රුපියල් දෙදහස් පන්සියයක් විය යුතු ය.

**10.** (1) පෙට්‍රල් හෝ ඩීසල් මගින් ක්‍රියාත්මක වන්නා වූ ද, මේ නියෝගවල VI වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන පන්තියකට අයත් වූ ද, II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති බරකින් යුක්ත වූ ද, මෝටර් වාහනයක් සඳහා ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව ඒ උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) (අ) විදුලි බලයෙන්, සූර්ය බලයෙන්, ද්‍රව පෙට්‍රෝලියම් වායුවෙන් හෝ විකල්ප ඉන්ධන මගින් ක්‍රියාත්මක වන මෝටර් වාහනයක් සඳහා ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව මේ නියෝගවල VI වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන පන්තියකට සමාන පන්තියකට අයත් වූ ද, II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති බරට සමාන බරකින් යුක්ත වූ ද පෙට්‍රල් මෝටර් වාහනයක් සඳහා ගෙවිය යුතු, ඒ උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවෙන් සියයට පනහක් විය යුතු ය; සහ

(ආ) විදුලි බලයෙන්, සූර්ය බලයෙන්, ද්‍රව පෙට්‍රෝලියම් වායුවෙන් හෝ විකල්ප ඉන්ධන සමඟ ඛනිජ තෙල් නිෂ්පාදනයක් මගින් ක්‍රියාත්මක වන මෝටර් වාහනයක් සඳහා ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව මේ නියෝගවල VI වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන පන්තියකට සමාන වාහන පන්තියකට අයත් වූ ද, II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති බරට සමාන බරකින් යුක්ත වූ ද, මෝටර් වාහනයක් සඳහා ගෙවිය යුතු, ඒ උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව ම විය යුතු ය.

**11.** මේ නියෝගවල VII වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති බස් රථ හා එවැනි වෙනත් මෝටර් වාහන සඳහා ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

**12.** යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, 10 වන නියෝගයේ හෝ 11 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති අදාළ වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව, (මේ නියෝගයේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ තැනැත්තා විසින් ඒ ගෙවීම සිදු කළ යුතු දිනයේ දී හෝ එදිනට පෙර ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තාගෙන් පහත දැක්වෙන ආකාරයට ගණනය කරනු ලබන අතිරේක ප්‍රමාද ගාස්තුවක් අය කරනු ලැබිය යුතු ය:-

(අ) එම ගෙවීම නියමිත දිනයේ සිට මාස තුනක් ඇතුළත සිදු කරනු ලැබූ අවස්ථාවක, ගෙවිය යුතු අදාළ වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුවෙන් සියයට දහයක්;

(ආ) එම ගෙවීම නියමිත දිනයේ සිට මාස තුනකට පසු, එහෙත් නියමිත දිනයේ සිට අවුරුද්දක් ඇතුළත සිදු කරනු ලැබූ අවස්ථාවක, ගෙවිය යුතු අදාළ වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුවෙන් සියයට විස්සක්; සහ

(ඇ) එම ගෙවීම නියමිත දිනයේ සිට වසරකට පසු සිදු කරනු ලැබූ අවස්ථාවක, ගෙවිය යුතු අදාළ වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුවෙන් සියයට තිහක්.

**13.** (1) යම් ගරාජයක්, ලොරි බොඩි නිෂ්පාදන කර්මාන්තශාලාවක්, ට්‍රේලර් නිෂ්පාදන කර්මාන්තශාලාවක්, වාහන එකලස් කිරීමේ කර්මාන්තශාලාවක්, වාහන නිෂ්පාදන කර්මාන්තශාලාවක්, නියෝජිතයකු හෝ වෙළෙන්දකු හා සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ නියෝගවල VIII වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති -

(අ) පරීක්ෂා කිරීමේ සහ ලියාපදිංචි කිරීමේ;

(ආ) ලියාපදිංචිය අලුත් කිරීමේ;

(ඇ) ලියාපදිංචි කිරීමේ සහතිකයක අනුපිටපතක් නිකුත් කිරීමේ,

කාර්ය සිදු කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) මේ නියෝගවල VIII වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති-

(අ) රියදුරු පාසලක් ලියාපදිංචි කිරීමේ සහ එහි ලියාපදිංචිය අලුත් කිරීමේ; සහ

(ආ) රියදුරු උපදේශකයකු හෝ සහකාර රියදුරු උපදේශකයකු ලියාපදිංචි කිරීමේ සහ ඔවුන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමේ,

කාර්ය කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තුව සහ රියදුරු පාසලක ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් වන ප්‍රමාද ගාස්තු සහ රියදුරු උපදේශකයකුගේ හෝ සහකාර උපදේශකයකුගේ ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් වන ප්‍රමාද ගාස්තු, "ඒ" පන්තිය, "බී" පන්තිය සහ "සී" පන්තිය යටතට ගැනෙන රියදුරු පාසල්, රියදුරු උපදේශකයන් හෝ සහකාර රියදුරු උපදේශකයන් සඳහා ඒ උපලේඛනයේ පිළිවෙළින් III වන තීරයේ, IV වන තීරයේ සහ V වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

**14.** (1) මේ නියෝගවල IX වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් කාර්ය කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තුව, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) මේ නියෝගවල IX වන උපලේඛනයේ I වන තීරයේ 10 (ඇ) වන අයිතමයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති කාර්ය කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කිරීම සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ගෙවිය යුතු ගාස්තුව, 2009 මාර්තු මස 13 වන දින සිට 2010 මැයි මස 2 වන දින දක්වා වූ කාලසීමාව තුළ ලියාපදිංචි කරන ලද්දා වූ ද දළ වාහන බර කි.ග්‍රෑ. 3500 ට අඩු වූ ද මෝටර් ලොරි සඳහා අදාළ නොවිය යුතු ය.

**15.** සංශෝධිත පරිදි වූ 2011 සැප්තැම්බර් මස 9 වන දින අංක 1722/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2011 මෝටර් වාහන (ගාස්තු) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**16.** මේ නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන්, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත අදහස් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"ද්විත්ව කාර්ය වාහනය" , "දළ වාහන බර (GVW)", "අත් ට්‍රැක්ටරය", "බර මෝටර් කෝච් රථය", "බර මෝටර් ලොරිය", "ඉඩම් වාහනය", "සැහැල්ලු මෝටර් කෝච් රථය", "සැහැල්ලු මෝටර් සයිකලය", "සැහැල්ලු මෝටර් ලොරිය", "මෝටර් ගිලන් රථය", "මෝටර් රථය", "මෝටර් කෝච් රථය", "මෝටර් සයිකලය", "මෝටර් අවමංගල්‍ය රථය", "මෝටර් නිවස", "මෝටර් ලොරිය", "මෝටර් ට්‍රයිසිකලය", "මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය", "බස් රථය", "පෞද්ගලික කෝච් රථය", "කොඩ්‍රිසයිකලය", "විශේෂ කාර්ය වාහනය" සහ "ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය" යන්නට, පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"බර ට්‍රේලරය" යන්නෙන්, තාර බර කිලෝග්‍රෑම් 750 ක් ඉක්මවන්නා වූ මෝටර් වාහනයකට සම්බන්ධ කර එමගින් අදිනු ලබන්නා වූ ද, සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් භාණ්ඩ, ගෑස් හෝ ද්‍රව වර්ග ප්‍රවාහනය සඳහා නිෂ්පාදනය ඇත්තා වූ ද, සෑම වර්ගයකට ම අයත් ලැගුම් රථයක් සහ ට්‍රේලරයක් අදහස් වන නමුත් ඊට මෝටර් සයිකලයකට සම්බන්ධ කරන ලද පැති මෝටර් රථයක් ඇතුළත් නොවේ;

"සැහැල්ලු ට්‍රේලරය" යන්නෙන්, තාර බර කිලෝග්‍රෑම් 750 ක් නොඉක්මවන්නා වූ මෝටර් වාහනයකට සම්බන්ධ කර එමගින් අදිනු ලබන්නා වූ ද, භාණ්ඩ, ගෑස් හෝ ද්‍රව වර්ග ප්‍රවාහනය සඳහා සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය කර ඇත්තා වූ ද, සෑම වර්ගයකට ම අයත් ලැගුම් රථයක් සහ ට්‍රේලරයක් අදහස් වන නමුත් ඊට මෝටර් සයිකලයකට සම්බන්ධ කරන ලද පැති මෝටර් රථයක් ඇතුළත් නොවේ;

"විකල්ප ඉන්ධන මගින් ක්‍රියාත්මක වන මෝටර් වාහනය" යන්නෙන්, පෙට්‍රල්, ඩීසල් හෝ ගෑස් හැර වෙනත් විකල්ප ඉන්ධන මගින් ම පමණක් ක්‍රියාත්මක වන යම් මෝටර් වාහනයක් අදහස් වන නමුත් ඊට ද්විත්ව ඉන්ධන වාහන සහ විදුලි බලයෙන් ක්‍රියාත්මක වන මෝටර් වාහන ඇතුළත් නොවේ;

"විදුලි බලය මගින් ක්‍රියාත්මක වන මෝටර් වාහන" යන්නෙන්, විදුලි බලය හෝ බලශක්තිය මගින් ක්‍රියාත්මක වන යම් මෝටර් වාහනයක් අදහස් වේ;

"සාමාන්‍ය පදනම" යන්නෙන්, යම් කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා ඉල්ලීමක් කරන ලද දින සිට වැඩ කරන දින විසි එකක කාලසීමාවකින් පසුව එම කර්තව්‍යය ඉටු කිරීම අදහස් වේ; සහ

"ප්‍රමුඛතා පදනම" යන්නෙන්, යම් කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා ඉල්ලීමක් කරන ලද දින සිට වැඩ කරන දින විසි එකක කාලසීමාවක් ඇතුළත එම කර්තව්‍යය ඉටු කිරීම අදහස් වේ.

I වන උපලේඛනය

[2 වන නියෝගය]

**පළමු ලියාපදිංචිය සඳහා ගාස්තු**

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| වාහන වර්ගය | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| 1. මෝටර් රථය - සීසී 1600 හෝ සීසී 1600 ට අඩු/ කිලෝවොට් 80 හෝ කිලෝවොට් 80 ට අඩු | 25,000.00 |
| 2. මෝටර් රථය - සීසී 1600 ට වැඩි/ කිලෝවොට් 80 ට වැඩි | 40,000.00 |
| 3. ද්විත්ව කාර්ය වාහනය - සීසී 1000 හෝ සීසී 1000 ට අඩු/ කිලෝවොට් 50 හෝ කිලෝවොට් 50 ට අඩු | 20,000.00 |
| 4. ද්විත්ව කාර්ය වාහනය - සීසී 1000 ට වැඩි/ කිලෝවොට් 50 ට වැඩි | 25,000.00 |
| 5. ඉඩම් වාහනය | 8, 000.00 |
| 6. අත් ට්‍රැක්ටරය | 2,000.00 |
| 7. විශේෂ කාර්ය වාහනය | 30,000.00 |
| 8. සැහැල්ලු මෝටර් සයිකලය | 3,000.00 |
| 9. මෝටර් සයිකලය | 3,000.00 |
| 10. මෝටර් ට්‍රයිසිකලය | 5,000.00 |
| 11. මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය | 5,000.00 |
| 12. කොඩ්‍රිසයිකලය | 7,000.00 |
| 13. මෝටර් නිවස | 35,000.00 |
| 14. සැහැල්ලු මෝටර් ලොරිය | 7,000.00 |
| 15. මෝටර් ලොරිය | 7,000.00 |
| 16. ප්‍රයිම් මූවර් (මෝටර් ලොරිය/ බර මෝටර් ලොරිය) | 25,000.00 |
| 17. සැහැල්ලු මෝටර් කෝච් රථය | 7,000.00 |
| 18. මෝටර් කෝච් රථය | 7,000.00 |
| 19. අබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය | 2,000.00 |
| 20. මෝටර් ගිලන් රථය | 10,000.00 |
| 21. මෝටර් අවමංගල්‍ය රථය | 10,000.00 |
| 22. බර ට්‍රේලරය | 15,000.00 |
| 23. සැහැල්ලු ට්‍රේලරය | 7,000.00 |

II වන උපලේඛනය

[3 වන නියෝගය]

ප්‍රමාද වූ පළමු ලියාපදිංචිය සඳහා ගාස්තු

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන වර්ගය* | *ප්‍රමාද වීමේ කාලසීමාව* | *ප්‍රමාද ගාස්තුව (රු.)* |
| 1. මෝටර් රථය<br>2. මොටර් නිවස | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 12,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 15,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 20,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 30,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 50,000.00 |
| 3. ද්විත්ව කාර්ය වාහනය - (සීසී 1000 හෝ සීසී 1000 ට අඩු/ කිලෝවොට් 50 හෝ කිලෝවොට් 50 ට අඩු) | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 6,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 10,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 15,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 20,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 35,000.00 |
| 4. ද්විත්ව කාර්ය වාහනය - (සීසී 1000 ට වැඩි/ කිලෝවොට් 50 ට වැඩි) | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 12,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 15,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 20,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 30,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 50,000.00 |
| 5. ඉඩම් වාහනය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 5,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 8,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 10,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 12,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 15,000.00 |
| 6. අත් ට්‍රැක්ටරය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 3,500.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 4,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 5,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 6,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 8,000.00 |

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන වර්ගය* | *ප්‍රමාද වීමේ කාලසීමාව* | *ප්‍රමාද ගාස්තුව (රු.)* |
| 7. විශේෂ කාර්ය වාහනය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 6,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 10,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 14,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 18,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 20,000.00 |
| | | |
| 8. සැහැල්ලු මෝටර් සයිකලය<br>9. මෝටර් සයිකලය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 3,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 3,500.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 4,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 5,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 8,000.00 |
| 10. මෝටර් ට්‍රයිසිකලය<br>11. මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 5,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 6,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 8,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 10,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 12,000.00 |
| 12. කොඩ්‍රිසයිකලය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 8,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 10,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 12,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 14,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 16,000.00 |
| 13. සැහැල්ලු මෝටර් ලොරිය<br>14. මෝටර් ලොරිය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 8,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 10,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 13,600.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 15,600.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 19,600.00 |
| | | |
| 15. ප්‍රයිම් මූවර් (මෝටර් ලොරිය/බර මෝටර් ලොරිය) | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 8,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 10,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 14,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 18,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 20,000.00 |

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| වාහන වර්ගය | ප්‍රමාද වීමේ කාලසීමාව | ප්‍රමාද ගාස්තුව (රු.) |
| 16. සැහැල්ලු මෝටර් කෝච් රථය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 14,000.00 |
| 17. මෝටර් කෝච් රථය | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 16,800.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 19,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 21,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 27,000.00 |
| 18. ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 4,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 5,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 6,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 8,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 10,000.00 |
| | | |
| 19. මෝටර් ගිලන් රථය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 4,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 5,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 6,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 8,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 9,000.00 |
| 20. මෝටර් අවමංගල්‍ය රථය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 12,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 14,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 16,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 18,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 20,000.00 |
| 21. බර ට්‍රේලරය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 10,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 12,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 14,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 16,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 18,000.00 |
| 22. සැහැල්ලු ට්‍රේලරය | දින 90 කට වැඩි එහෙත් අවුරුදු 1 කට අඩු | 4,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 කට අඩු | 6,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 කට අඩු | 8,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 කට අඩු | 10,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 12,000.00 |

III වන උපලේඛනය

[5 වන නියෝගය]

**නව අයිතිකරුවකු ලියාපදිංචි කිරීම සඳහා වන ගාස්තු**

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* | *IV වන තීරය* |
|---|---|---|---|
| *වාහන වර්ගය* | *සමාන්‍ය පදනම මත ගාස්තුව (රු.)* | *ප්‍රමුඛතා පදනම මත ගාස්තුව (රු.)* | *එක් දින පදනම මත ගාස්තුව (රු.)* |
| 1. මෝටර් රථය | 5,000.00 | 6,500.00 | 7,500.00 |
| 2. ද්විත්ව කාර්ය වාහනය | 5,000.00 | 6,500.00 | 7,500.00 |
| 3. ඉඩම් වාහනය | 2,400.00 | 3,000.00 | 4,000.00 |
| 4. අත් ට්‍රැක්ටරය | 1,000.00 | 1,300.00 | 2,300.00 |
| 5. විශේෂ කාර්ය වාහනය | 5,000.00 | 6,500.00 | 7,500.00 |
| 6. සැහැල්ලු මෝටර් සයිකලය | 1,000.00 | 1,300.00 | 2,300.00 |
| 7. මෝටර් සයිකලය | 1,000.00 | 1,300.00 | 2,300.00 |
| 8. මෝටර් ට්‍රයිසිකලය | 1,000.00 | 1,300.00 | 2,300.00 |
| 9. මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය | 1,000.00 | 1,300.00 | 2,300.00 |
| 10. කොඩ්‍රිසයිකලය | 3,000.00 | 4,000.00 | 6,000.00 |
| 11. මෝටර් නිවස | 5,000.00 | 6,000.00 | 7,500.00 |
| 12. සැහැල්ලු මෝටර් ලොරිය | 5,000.00 | 6,500.00 | 7,500.00 |
| 13. මෝටර් ලොරිය | 5,000.00 | 6,500.00 | 7,500.00 |
| 14. ප්‍රයිම් මූවර් (මෝටර් ලොරිය/ බර මෝටර් ලොරිය) | 5,000.00 | 6,500.00 | 7,500.00 |
| 15. සැහැල්ලු මෝටර් කෝච් රථය | 5,000.00 | 6,500.00 | 7,500.00 |
| 16. මෝටර් කෝච් රථය | 5,000.00 | 6,500.00 | 7,500.00 |
| 17.ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය | 1,000.00 | 1,300.00 | 2,300.00 |
| 18. මෝටර් ගිලන් රථය | 2,000.00 | 2,600.00 | 3,600.00 |
| 19. මෝටර් අවමංගල්‍ය රථය | 2,000.00 | 2,600.00 | 3,600.00 |
| 20. බර ට්‍රේලරය | 4,000.00 | 5,200.00 | 6,200.00 |
| 21. සැහැල්ලු ට්‍රේලරය | 2,000.00 | 2,600.00 | 3,600.00 |

IV වන උපලේඛනය

[6 වන නියෝගය]

**නව අයිතිකරු ලියාපදිංචි කිරීම ප්‍රමාද වීම සඳහා වන ගාස්තු**

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන වර්ගය* | *දිනකට ප්‍රමාද ගාස්තුව (රු.)* | *උපරිම ප්‍රමාද ගාස්තුව (රු.)* |
| 1. මෝටර් රථය | 100.00 | 100,000.00 |
| 2. ද්විත්ව කාර්ය වාහනය | 100.00 | 100,000.00 |
| 3. ඉඩම් වාහනය | 50.00 | 50,000.00 |
| 4. අත් ට්‍රැක්ටරය | 25.00 | 25,000.00 |
| 5. විශේෂ කාර්ය වාහනය | 100.00 | 100,000.00 |
| 6. සැහැල්ලු මෝටර් සයිකලය | 50.00 | 50,000.00 |
| 7. මෝටර් සයිකලය | 50.00 | 50,000.00 |
| 8. මෝටර් ට්‍රයිසිකලය | 50.00 | 50,000.00 |
| 9. මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය | 50.00 | 50,000.00 |
| 10. කොඩ්‍රිසයිකලය | 50.00 | 50,000.00 |
| 11. මෝටර් නිවස | 100.00 | 100,000.00 |
| 12. සැහැල්ලු මෝටර් ලොරිය | 100.00 | 100,000.00 |
| 13. මෝටර් ලොරිය | 100.00 | 100,000.00 |
| 14. ප්‍රයිම් මූවර් (මෝටර් ලොරිය/ බර මෝටර් ලොරිය) | 100.00 | 100,000.00 |
| 15. සැහැල්ලු මෝටර් කෝච් රථය | 100.00 | 100,000.00 |
| 16. මෝටර් කෝච් රථය | 100.00 | 100,000.00 |
| 17. ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය | 25.00 | 25,000.00 |
| 18. මෝටර් ගිලන් රථය | 100.00 | 100,000.00 |
| 19. මෝටර් අවමංගල්‍ය රථය | 100.00 | 100,000.00 |
| 20. බර ට්‍රේලරය | 100.00 | 100,000.00 |
| 21. සැහැල්ලු ට්‍රේලරය | 50.00 | 50,000.00 |

V වන උපලේඛනය

[7 වන නියෝගය]

**ලියාපදිංචි කිරීමේ සහතිකයක අනුපිටපතක් නිකුත් කිරීම සඳහා වන ගාස්තු**

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *වාහන වර්ගය* | *සාමාන්‍ය පදනම මත ගාස්තුව (රු.)* |
| 1. මෝටර් රථය, ද්විත්ව කාර්ය වාහනය, විශේෂ කාර්ය වාහනය, මෝටර් නිවස, සැහැල්ලු මෝටර් ලොරිය, මෝටර් ලොරිය, ප්‍රයිම් මූවර්, සැහැල්ලු මෝටර් කෝච් රථය, මෝටර් කෝච් රථය, මෝටර් ගිලන් රථය, මෝටර් අවමංගල්‍ය රථය | 6,500.00 |
| 2. මෝටර් සයිකලය, මෝටර් ට්‍රයිසිකලය, ඉඩම් වාහනය සහ ඉහත නිශ්චිතව දක්වා ඇති 1 වන වාහන වර්ගය යටතේ නිශ්චිතව දක්වා නොමැති අනෙකුත් වාහන | 3,500.00 |

VI වන උපලේඛනය

[10 වන නියෝගය]

**වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තු**

*I වන කොටස*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන පන්තිය* | *බර පැටවීමට පෙර බර* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| 1. මෝටර් රථය | (අ) (i) කි.ග්‍රෑ. 500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 762 කට අඩු (පෙට්‍රල්) | 2,500.00 |
| | (ii) කි.ග්‍රෑ. 500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 762 කට අඩු (ඩීසල්) | 3,900.00 |
| | (ආ) (i) කි.ග්‍රෑ. 762 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 1,016 කට අඩු (පෙට්‍රල්) | 2,600.00 |
| | (ii) කි.ග්‍රෑ. 762 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 1,016 කට අඩු (ඩීසල්) | 5,000.00 |
| | (ඇ) (i) කි.ග්‍රෑ. 1,016 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 1,270 කට අඩු (පෙට්‍රල්) | 4,000.00 |
| | (ii) කි.ග්‍රෑ. 1,016 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 1,270 කට අඩු (ඩීසල්) | 7,500.00 |
| | (ඈ) (i) කි.ග්‍රෑ. 1,270 ක් හෝ ඊට වැඩි (පෙට්‍රල්) | 5,000.00 |
| | (ii) කි.ග්‍රෑ. 1,270 ක් හෝ ඊට වැඩි (ඩීසල්) | 10,000.00 |

*II වන කොටස*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන පන්තිය* | *දළ වාහන බර* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| 2. ද්විත්ව කාර්ය වාහනය<br><br>3. මෝටර් නිවස | (අ ) (i) කි.ග්‍රෑ. 1,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 1,000 කට අඩු (ඩීසල්)<br><br>(ආ) (i) කි.ග්‍රෑ. 1,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 1,500 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 1,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 1,500 කට අඩු (ඩීසල්)<br><br>(ඇ) (i) කි.ග්‍රෑ. 1,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 1,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2,000 කට අඩු (ඩීසල්)<br><br>(ඈ) (i) කි.ග්‍රෑ. 2,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2,500 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 2,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2,500 කට අඩු (ඩීසල්)<br><br>(ඉ) (i) කි.ග්‍රෑ. 2,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 3,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 2,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 3,000 කට අඩු (ඩීසල්)<br><br>(ඊ) (i) කි.ග්‍රෑ. 3,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 3,500 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 3,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 3,500 කට අඩු (ඩීසල්)<br><br>(උ) (i) කි.ග්‍රෑ. 3,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 4,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 3,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 4,000 කට අඩු (ඩීසල්)<br><br>(ඌ) (i) කි.ග්‍රෑ. 4,000 ක් හෝ ඊට වැඩි (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 4,000 ක් හෝ ඊට වැඩි (ඩීසල්) | 2,500.00<br>4,500.00<br><br>3,000.00<br>5,000.00<br><br>3,500.00<br>5,500.00<br><br>4,000.00<br>7,000.00<br><br>5,500.00<br>11,500.00<br><br>12,500.00<br>12,500.00<br><br>15,000.00<br>15,000.00<br><br>19,000.00<br>19,000.00 |
| 4. ඉඩම් වාහනය<br><br>5. අත් ට්‍රැක්ටරය<br><br>6. සැහැල්ලු ට්‍රේලරය<br><br>7. ට්‍රැක්ටර් ට්‍රේලරය | (අ) කි.ග්‍රෑ. 1,778 කට අඩු<br>(ආ) කි.ග්‍රෑ. 1,778 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2,032 කට අඩු<br>(ඇ) කි.ග්‍රෑ. 2,032 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2,540 කට අඩු<br>(ඈ) කි.ග්‍රෑ. 2,540 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 3,048 කට අඩු<br>(ඉ) කි.ග්‍රෑ. 3,048 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 3,556 කට අඩු<br>(ඊ) කි.ග්‍රෑ. 3,556 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 5,080 කට අඩු<br>(උ) කි.ග්‍රෑ. 5,080 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 15,240 කට අඩු<br>(ඌ) කි.ග්‍රෑ. 15,240 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 25,400 කට අඩු<br>(එ) කි.ග්‍රෑ. 25,400 ක් හෝ ඊට වැඩි | 600.00<br>1,200.00<br>1,400.00<br>1,700.00<br>2,000.00<br>2,100.00<br>3,000.00<br>3,500.00<br>4,500.00 |
| 8. සැහැල්ලු මෝටර් සයිකලය | | 900.00 |
| 9. මෝටර් සයිකලය | | 900.00 |
| 10. මෝටර් ට්‍රයිසිකලය | | 1,000.00 |

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන පන්තිය* | *දළ වාහන බර* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| 11. මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය | | 1,000.00 |
| 12. කොඩ්‍රිසයිකලය | | 1,300.00 |
| 13. විශේෂ කාර්ය වාහනය | (අ) (i) කි.ග්‍රෑ. 2,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 2,000 කට අඩු (ඩීසල්) | 2,000.00<br>4,000.00 |
| 14. සැහැල්ලු මෝටර් ලොරිය | (ආ) (i) කි.ග්‍රෑ. 2,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 5,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 2,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 5,000 කට අඩු (ඩීසල්) | 2,500.00<br>5,000.00 |
| 15. මෝටර් ලොරිය | (ඇ) (i) කි.ග්‍රෑ. 5,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 10,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 5,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 10,000 කට අඩු (ඩීසල්) | 3,500.00<br>7,500.00 |
| 16. ප්‍රයිම් මූවර් - මෝටර් ලොරිය | (ඈ) (i) කි.ග්‍රෑ. 10,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 15,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 10,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 15,000 කට අඩු (ඩීසල්) | 4,000.00<br>9,000.00 |
| 17. මෝටර් ගිලන් රථය | (ඉ) (i) කි.ග්‍රෑ. 15,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 20,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 15,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 20,000 කට අඩු (ඩීසල්) | 6,000.00<br>12,500.00 |
| 18. මෝටර් අවමංගල්‍ය රථය | (ඊ) (i) කි.ග්‍රෑ. 20,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 25,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 20,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 25,000 කට අඩු (ඩීසල්) | 6,000.00<br>15,000.00 |
| | (උ) (i) කි.ග්‍රෑ. 25,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 30,000 කට අඩු (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 25,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 30,000 කට අඩු (ඩීසල්) | 7,500.00<br>17,500.00 |
| | (ඌ) (i) කි.ග්‍රෑ. 30,000 ක් හෝ ඊට වැඩි (පෙට්‍රල්)<br>(ii) කි.ග්‍රෑ. 30,000 ක් හෝ ඊට වැඩි (ඩීසල්) | 9,000.00<br>19,000.00 |
| 19. ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය | (අ) කි.ග්‍රෑ. 750 කට අඩු (පෙට්‍රල්)<br>(ආ) කි.ග්‍රෑ. 750 කට අඩු (ඩීසල්)<br>(ඇ) කි.ග්‍රෑ. 750 ක් හෝ ඊට වැඩි (පෙට්‍රල්)<br>(ඈ) කි.ග්‍රෑ. 750 ක් හෝ ඊට වැඩි (ඩීසල්) | 800.00<br>900.00<br>1,000.00<br>1,100.00 |
| 20. බර ට්‍රේලරය<br>21. ලොරි ට්‍රේලරය | (අ) කි.ග්‍රෑ. 2,000 කට අඩු<br>(ආ) කි.ග්‍රෑ. 2,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ 5,000 කට අඩු<br>(ඇ) කි.ග්‍රෑ. 5,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ 10,000 කට අඩු<br>(ඈ) කි.ග්‍රෑ. 10,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ 15,000 කට අඩු<br>(ඉ) කි.ග්‍රෑ. 15,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ 20,000 කට අඩු<br>(ඊ) කි.ග්‍රෑ. 20,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ 25,000 කට අඩු<br>(උ) කි.ග්‍රෑ. 25,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ 30,000 කට අඩු<br>(ඌ) කි.ග්‍රෑ. 30,000 ක් හෝ ඊට වැඩි | 4,000.00<br>5,000.00<br>7,500.00<br>9,000.00<br>12,500.00<br>15,000.00<br>17,500.00<br>19,000.00 |

VII වන උපලේඛනය

[11 වන නියෝගය]

**වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තු**

| I වන තීරය | II වන තීරය |
|---|---|
| වාහන පන්තිය | ගෙවිය යුතු ගාස්තුව (එක් මගී ආසනයක් සඳහා) (රු.) |
| 1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථය | 50.00 |
| 2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයකට හැර වෙනත් තැනැත්තකුට අයත් බස් රථය | 200.00 |
| 3. පෞද්ගලික මෝටර් කෝච් රථය, පෞද්ගලික සැහැල්ලු මෝටර් කෝච් රථය හෝ පෞද්ගලික බර මෝටර් කෝච් රථය | 650.00 |

VIII වන උපලේඛනය

[13 වන නියෝගය]

**ගරාජ ආදිය ලියාපදිංචි කිරීම සඳහා වන ගාස්තු**

| I වන තීරය | II වන තීරය | III වන තීරය | IV වන තීරය | V වන තීරය |
|---|---|---|---|---|
| කාර්යය | සාමාන්‍ය පදනම මත ගාස්තුව (රු.) | | | |
| | | "ඒ" පන්තිය | "බී" පන්තිය | "සී" පන්තිය |
| 1. ගරාජයක්, ලොරි බොඩි නිෂ්පාදන කර්මාන්තශාලාවක් හෝ ට්‍රේලර් නිෂ්පාදන කර්මාන්තශාලාවක් පරීක්ෂා කිරීම සහ ලියාපදිංචි කිරීම | 35,000.00 | - | - | - |
| 2. වාහන එකලස් කිරීමේ කර්මාන්තශාලාවක් පරීක්ෂා කිරීම සහ ලියාපදිංචි කිරීම | 100,000.00 | - | - | - |
| 3. වාහන නිෂ්පාදන කර්මාන්තශාලාවක් පරීක්ෂා කිරීම සහ ලියාපදිංචි කිරීම | 100,000.00 | - | - | - |
| 4. ගරාජයක, ලොරි බොඩි නිෂ්පාදන කර්මාන්තශාලාවක හෝ ට්‍රේලර් නිෂ්පාදන කර්මාන්තශාලාවක ලියාපදිංචිය අලුත් කිරීම | 15,000.00 | - | - | - |
| 5. වාහන එකලස් කිරීමේ කර්මාන්තශාලාවක ලියාපදිංචිය අලුත් කිරීම | 70,000.00 | - | - | - |
| 6. වාහන නිෂ්පාදන කර්මාන්තශාලාවක ලියාපදිංචිය අලුත් කිරීම | 70,000.00 | - | - | - |
| 7. නියෝජිතයකු හෝ වෙළෙන්දකු පරීක්ෂා කිරීම සහ ලියාපදිංචි කිරීම | 125,000.00 | - | - | - |

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* | *IV වන තීරය* | *V වන තීරය* |
|---|---|---|---|---|
| *කාර්යය* | *සාමාන්‍ය පදනම මත ගාස්තුව (රු.)* | | | |
| | | *"ඒ" පන්තිය* | *"බී" පන්තිය* | *"සී" පන්තිය* |
| 8. නියෝජිතයකුගේ හෝ වෙළෙන්දකුගේ ලියාපදිංචිය අලුත් කිරීම | 63,000.00 | - | - | - |
| 9. ගරාජයක, ලොරි බොඩි නිෂ්පාදන කර්මාන්තශාලාවක, ට්‍රේලර් නිෂ්පාදන කර්මාන්තශාලාවක, වාහන එකලස් කිරීමේ කර්මාන්තශාලාවක, වාහන නිෂ්පාදන කර්මාන්තශාලාවක, නියෝජිතයකුගේ හෝ වෙළෙන්දකුගේ ලියාපදිංචි කිරීමේ සහතිකයේ අනුපිටපතක් නිකුත් කිරීම | 1,000.00 | - | - | - |
| 10. රියදුරු පාසලක් ලියාපදිංචි කිරීම (අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා) | - | 25,000.00 | 19,000.00 | 12,500.00 |
| 11. රියදුරු පාසලක ලියාපදිංචිය අලුත් කිරීම (අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා) | - | 12,500.00 | 10,000.00 | 8,000.00 |
| 12. රියදුරු පාසලක ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් වන ප්‍රමාද ගාස්තු (මාසයක ප්‍රමාදයක් සඳහා) | - | 1,000.00 | 500.00 | 400.00 |
| 13. රියදුරු උපදේශකයකු ලියාපදිංචි කිරීම සහ රියදුරු උපදේශකයකුට බලපත්‍රයක් නිකුත් කිරීම (අවුරුදු දෙකක කාලයක් සඳහා) | - | 7,500.00 | 7,500.00 | 7,500.00 |
| 14. රියදුරු උපදේශකයකුගේ ලියාපදිංචිය අලුත් කිරීම (අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා) | | 7,500.00 | 7,500.00 | 7,500.00 |
| 15. රියදුරු උපදේශකයකුගේ ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් වන ප්‍රමාද ගාස්තු (මාසයක ප්‍රමාදයක් සඳහා) | - | 500.00 | 500.00 | 500.00 |
| 16. සහකාර රියදුරු උපදේශකයකු ලියාපදිංචි කිරීම සහ සහකාර රියදුරු උපදේශකයකුට බලපත්‍රයක් නිකුත් කිරීම (අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා) | - | - | - | 5,000.00 |
| 17. සහකාර රියදුරු උපදේශකයකුගේ ලියාපදිංචිය අලුත් කිරීම (අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා) | - | - | - | 5,000.00 |
| 18. සහකාර රියදුරු උපදේශකයකුගේ ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් වන ප්‍රමාද ගාස්තු (මාසයක ප්‍රමාදයක් සඳහා) | | | | 500.00 |
| 19. රියදුරු පාසලක් ලියාපදිංචි කිරීමේ සහතිකයේ අනුපිටපතක් නිකුත් කිරීම | | 7,000.00 | 7,000.00 | 7,000.00 |
| 20. රියදුරු උපදේශකයකුගේ ලියාපදිංචි කිරීමේ සහතිකයේ අනුපිටපතක් නිකුත් කිරීම | | 5,000.00 | 5,000.00 | 5,000.00 |
| 21. සහකාර රියදුරු උපදේශකයකුගේ ලියාපදිංචි කිරීමේ සහතිකයේ අනුපිටපතක් නිකුත් කිරීම | | - | - | 3,000.00 |

IX වන උපලේඛනය

[14 වන නියෝගය]

**විවිධ ගාස්තු**

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *කාර්යය* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| 1. මෝටර් වාහනයක ලියාපදිංචියට අදාළ තොරතුරු පිළිබඳ පරිගණක උද්ධෘතයක් නිකුත් කිරීම | 1000.00 |
| 2. ලියාපදිංචි සහතිකයේ විස්තර වෙනස් කිරීම | 3000.00 |
| 3. මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා මෝටර් රථ කොමසාරිස් කාර්යාලයේ වැසි අංක නිකුත් කිරීම | 10,000.00 |
| 4. පළමු ලියාපදිංචියේ වැසි අංකය වෙනස් වූ අවස්ථාවක වැසි අංකය සංශෝධනය කිරීම | 50,000.00 |
| 5. මෝටර් වාහනයක් පරීක්ෂා කිරීම- | |
| (අ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රය තුළ දී (මෝටර් සයිකලයක් හෝ සැහැල්ලු මෝටර් සයිකලයක් හැර) මෝටර් වාහනයක් පරීක්ෂා කිරීම | 1,000.00 |
| (ආ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රයෙන් පිටත දී (මෝටර් සයිකලයක් හෝ සැහැල්ලු මෝටර් සයිකලයක් හැර) මෝටර් වාහනයක් පරීක්ෂා කිරීම | 2,000.00 |
| 6. මෝටර් සයිකලයක් හෝ සැහැල්ලු මෝටර් සයිකලයක් පරීක්ෂා කිරීම- | |
| (අ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රය තුළ දී මෝටර් සයිකලයක් හෝ සැහැල්ලු මෝටර් සයිකලයක් පරීක්ෂා කිරීම | 500.00 |
| (ආ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රයෙන් පිටත දී මෝටර් සයිකලයක් හෝ සැහැල්ලු මෝටර් සයිකලයක් පරීක්ෂා කිරීම | 1,000.00 |
| 7. මෝටර් වාහනයක් මූලාදර්ශ ලෙස පරීක්ෂා කිරීම- | |
| (අ) මෝටර් සයිකලයක් හෝ සැහැල්ලු මෝටර් සයිකලයක් මූලාදර්ශ ලෙස පරීක්ෂා කිරීම | 5,000.00 |
| (ආ) වෙනත් යම් මෝටර් වාහනයක් මූලාදර්ශ ලෙස පරීක්ෂා කිරීම | 10,000.00 |
| 8. අනන්‍යතා සහතිකවල කාර්ය සඳහා මෝටර් වාහනයක් පරීක්ෂා කිරීම- | |
| (අ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රය තුළ දී (මෝටර් සයිකලයක් ද ඇතුළුව) මෝටර් වාහනයක් පරීක්ෂා කිරීම | 500.00 |
| (ආ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රයෙන් පිටත දී (මෝටර් සයිකලයක් ද ඇතුළුව) මෝටර් වාහනයක් පරීක්ෂා කිරීම | 1,000.00 |
| 9. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රයෙන් පිටත දී (මෝටර් සයිකලයක් ද ඇතුළුව) මෝටර් වාහනයක් පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රවාහන ගාස්තු | 3,000.00 |
| 10. මෝටර් වාහනයක් ලියාපදිංචි කර ඇති පන්තිය වෙනස් කිරීම (පරිවර්තනය කිරීම) සඳහා අවසර ලබා දීම- | |
| (අ) ද්විත්ව කාර්ය වාහනයක් මෝටර් කෝච් රථයක් හෝ සැහැල්ලු මෝටර් කෝච් රථයක් ලෙස වෙනස් කිරීම | 50,000.00 |
| (ආ) ද්විත්ව කාර්ය වාහනයක් මෝටර් ලොරියක් හෝ සැහැල්ලු මෝටර් ලොරියක් ලෙස වෙනස් කිරීම | 50,000.00 |

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *කාර්යය* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| (ඇ) මෝටර් කෝච් රථයක් හෝ සැහැල්ලු මෝටර් කෝච් රථයක් ද්විත්ව කාර්ය වාහනයක් ලෙස වෙනස් කිරීම- | |
| (i) පළමු ලියාපදිංචියේ සිට අවුරුද්දක් ඉකුත් වීමට පෙර | 320,000.00 |
| (ii) පළමු ලියාපදිංචියේ සිට අවුරුද්දක් ඉකුත් වූ පසු එහෙත් අවුරුදු දෙකක් ඉකුත් වීමට පෙර | 250,000.00 |
| (iii) පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දෙකක් ඉකුත් වූ පසු එහෙත් අවුරුදු තුනක් ඉකුත් වීමට පෙර | 200,000.00 |
| (iv) පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනක් ඉකුත් වූ පසු එහෙත් අවුරුදු දහයක් ඉකුත් වීමට පෙර | 160,000.00 |
| (v) පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දහයක් ඉකුත් වූ පසු | 320,000.00 |
| (ඈ) මෝටර් ලොරියක් හෝ සැහැල්ලු මෝටර් ලොරියක් ද්විත්ව කාර්ය වාහනයක් ලෙස වෙනස් කිරීම- | |
| (i) පළමු ලියාපදිංචි සිට අවුරුද්දක් ඉකුත් වීමට පෙර | 320,000.00 |
| (ii) පළමු ලියාපදිංචියේ සිට අවුරුද්දක් ඉකුත් වූ පසු එහෙත් අවුරුදු දෙකක් ඉකුත් වීමට පෙර | 250,000.00 |
| (iii) පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දෙකක් ඉකුත් වූ පසු එහෙත් අවුරුදු තුනක් ඉකුත් වීමට පෙර | 200,000.00 |
| (iv) පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනක් ඉකුත් වූ පසු එහෙත් අවුරුදු දහයක් ඉකුත් වීමට පෙර | 160,000.00 |
| (v) පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දහයක් ඉකුත් වූ පසු | 320,000.00 |
| (ඉ) මෝටර් කෝච් රථයක් හෝ සැහැල්ලු මෝටර් කෝච් රථයක් මෝටර් ලොරියක් හෝ සැහැල්ලු මෝටර් ලොරියක් ලෙස වෙනස් කිරීම | 75,000.00 |
| (ඊ) මෝටර් ලොරියක් හෝ සැහැල්ලු මෝටර් ලොරියක් මෝටර් කෝච් රථයක් හෝ සැහැල්ලු මෝටර් කෝච් රථයක් ලෙස වෙනස් කිරීම- | |
| (i) පළමු ලියාපදිංචියේ සිට අවුරුද්දක් ඉකුත් වීමට පෙර | 300,000.00 |
| (ii) පළමු ලියාපදිංචියේ සිට අවුරුද්දක් ඉකුත් වූ පසු එහෙත් අවුරුදු දෙකක් ඉකුත් වීමට පෙර | 200,000.00 |
| (iii) පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දෙකක් ඉකුත් වූ පසු එහෙත් අවුරුදු තුනක් ඉකුත් වීමට පෙර | 160,000.00 |
| (iv) පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනක් ඉකුත් වූ පසු එහෙත් අවුරුදු දහයක් ඉකුත් වීමට පෙර | 150,000.00 |
| (v) පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දහයක් ඉකුත් වූ පසු | 250,000.00 |
| (උ) මෝටර් ට්‍රයිසිකලයක් මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් ලෙස වෙනස් කිරීම හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් මෝටර් ට්‍රයිසිකලයක් ලෙස වෙනස් කිරීම | 15,000.00 |
| (ඌ) මෝටර් ලොරියක, සැහැල්ලු මෝටර් ලොරියක, බර මෝටර් ලොරියක හෝ ද්විත්ව කාර්ය වාහනයක බොඩියේ නිර්මාණය වෙනස් කිරීම- | |

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *කාර්යය* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| (i) සීසී 1000 ක් හෝ ඊට වැඩි එන්ජින් ධාරිතාවක් ඇති ඉහත සඳහන් වාහනයක් | 32,000.00 |
| (ii) සීසී 1000 ට අඩු එන්ජින් ධාරිතාවක් ඇති ඉහත සඳහන් වාහනයක් | 1,000.00 |
| (එ) නැරඹුම් සවාරි කාර්ය සඳහා, මෝටර් ලොරියක, සැහැල්ලු මෝටර් ලොරියක, බර මෝටර් ලොරියක හෝ ද්විත්ව කාර්ය වාහනයක බොඩියේ නිර්මාණය වෙනස් කිරීම | 32,000.00 |
| (ඒ) මෝටර් ලොරියක, සැහැල්ලු මෝටර් ලොරියක හෝ බර මෝටර් ලොරියක රියදුරු මැදිරිය වෙනස් කිරීම | 25,000.00 |
| 11. මෝටර් වාහනයක ඉන්ධන වර්ගය පරිවර්තනය කිරීම ලියාපදිංචි කිරීම -<br>(අ) මෝටර් රථ සහ ද්විත්ව කාර්ය වාහන - | |
| (i) පෙට්‍රල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ දී ඩීසල්වලට පරිවර්තනය කිරීම | 400,000.00 |
| (ii) පෙට්‍රල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුද්දක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 400,000.00 |
| (iii) පෙට්‍රල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දෙකක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 300,000. 00 |
| (iv) පෙට්‍රල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 200,000.00 |
| (v) පෙට්‍රල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනකට පසු සහ ඉන් ඔබ්බට ඩීසල්වලට පරිවර්තනය කිරීම | 100,000.00 |
| (vi) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ දී ඩීසල්වලට පරිවර්තනය කිරීම | 400,000.00 |
| (vii) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුද්දක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 400,000.00 |
| (viii) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දෙකක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 300,000.00 |
| (ix) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 200,000.00 |
| (x) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනකට පසු සහ ඉන් ඔබ්බට ඩීසල්වලට පරිවර්තනය කිරීම | 100,000.00 |
| (xi) ඩීසල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ දී පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 50,000.00 |
| (xii) ඩීසල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුද්දක් ඇතුළත පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 45,000.00 |
| (xiii) ඩීසල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දෙකක් ඇතුළත පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 40,000.00 |
| (xiv) ඩීසල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනක් ඇතුළත පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 35,000.00 |

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *කාර්යය* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| (xv) ඩීසල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනකට පසු සහ ඉන් ඔබ්බට පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 30,000.00 |
| (xvi) ඩීසල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ දී පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 50,000.00 |
| (xvii) ඩීසල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුද්දක් ඇතුළත පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 45,000.00 |
| (xviii) ඩීසල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුද දෙකක් ඇතුළත පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 40,000.00 |
| (xix) ඩීසල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනක් ඇතුළත පෙට්‍රල්වලට පරිවර්ථනය කිරීම | 35,000.00 |
| (xx) ඩීසල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනකට පසු සහ ඉන් ඔබ්බට පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 30,000.00 |
| (xxi) ඩීසල් මෝටර් රථයක් හෝ ද්විත්ව කාර්ය වාහනයක් විදුලි බලයට පරිවර්තනය කිරීම | 40,000.00 |
| (xxii) පෙට්‍රල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනක් ඇතුළත විදුලි මෝටර් රථයක් බවට පරිවර්ථනය කිරීම | 10,000.00 |
| (xxiii) පෙට්‍රල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනකට පසු විදුලි මෝටර් රථයක් බවට පරිවර්තනය කිරීම | 15,000.00 |
| (xxiv) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනක් ඇතුළත විදුලි ද්විත්ව කාර්ය වාහනයක් බවට පරිවර්තනය කිරීම | 10,000.00 |
| (xxv) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනකට පසු විදුලි ද්විත්ව කාර්ය වාහනයක් බවට පරිවර්තනය කිරීම | 15,000.00 |
| (ආ) වෙනත් වාහන :-<br>(i) පෙට්‍රල් මෝටර් ලොරියක්/ සැහැල්ලු මෝටර් ලොරියක්/ බර මෝටර් ලොරියක් ඩීසල්වලට පරිවර්තනය කිරීම | 100,000.00 |
| (ii) පෙට්‍රල් මෝටර් කෝච් රථයක්/ සැහැල්ලු මෝටර් කෝච් රථයක් / බර මෝටර් කෝච් රථයක් ඩීසල්වලට පරිවර්තනය කිරීම | 100,000.00 |
| (iii) පෙට්‍රල් මෝටර් ට්‍රයිසිකලයක්/ මෝටර් ට්‍රයිසිකල් වැන් රථයක් ඩීසල්වලට පරිවර්තනය කිරීම | 15,000.00 |
| (iv) ඩීසල් මෝටර් ට්‍රයිසිකලයක්/ මෝටර් ට්‍රයිසිකල් වැන් රථයක් පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 10,000.00 |
| (v) පෙට්‍රල් හෝ ඩීසල් මෝටර් ට්‍රයිසිකලයක්/ මෝටර් ට්‍රයිසිකල් වැන් රථයක් විදුලි බලයට පරිවර්තනය කිරීම | 2,000.00 |
| (vi) පෙට්‍රල් කොඩ්‍රිසයිකලයක් විදුලි කොඩ්‍රිසයිකලයක් බවට පරිවර්තනය කිරීම | 5,000.00 |
| (ඇ) එන්ජින් අංකය මෙරට තුළ දී කෙටීම | 3,000.00 |

| I වන තීරය | II වන තීරය |
|---|---|
| කාර්යය | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| 12. ආරක්ෂාව සැලකිල්ලට ගැනීමේ දී අවශ්‍ය වන කොන්දේසි ආදායම් බලපත්‍රයෙහි සහතික කිරීම- | |
| (අ) යෝග්‍යතා සහතික නිකුත් කිරීම පිණිස ගරාජයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් නිකුත් කිරීම | 2,000.00 |
| (ආ) යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ගරාජයක් ලියාපදිංචි කිරීම | 15,000.00 |
| (ඇ) පරීක්ෂා කිරීමේ වාර්තා සහ යෝග්‍යතා සහතික ඇතුළත් පොත් කට්ටලයක් නිකුත් කිරීම | 5,000.00 |
| 13. අදාළ බලධරයා වෙත පාවිච්චි නොකිරීමේ සහතිකයක් නිකුත් කිරීම - | |
| (අ) මෝටර් සයිකලය/ සැහැල්ලු මෝටර් සයිකලය (මාස හයකට වැඩි නොවන) | 100.00 |
| (ආ) මෝටර් ට්‍රයිසිකලය/ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය (මාස හයකට වැඩි නොවන) | 100.00 |
| (ඇ) කොඩ්‍රිසයිකලය (මාස හයකට වැඩි නොවන) | 100.00 |
| (ඈ) මෝටර් කෝච් රථය/ සැහැල්ලු මෝටර් කෝච් රථය/ බර මෝටර් කෝච් රථය (මාස හයකට වැඩි නොවන) | 250.00 |
| (ඉ) මෝටර් ලොරිය/ සැහැල්ලු මෝටර් ලොරිය/ බර මෝටර් ලොරිය (මාස හයකට වැඩි නොවන) | 250.00 |
| (ඊ) වෙනත් වාහන (මාස හයකට වැඩි නොවන) | 200.00 |
| (උ) මෝටර් සයිකලය/ සැහැල්ලු මෝටර් සයිකලය (මාස හයකට වැඩි වූ ද මාස දොළහකට නොවැඩි වූ ද) | 200.00 |
| (ඌ) මෝටර් ට්‍රයිසිකලය/ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය (මාස හයකට වැඩි වූ ද මාස දොළහකට නොවැඩි වූ ද) | 200.00 |
| (එ) කොඩ්‍රිසයිකලය (මාස හයකට වැඩි වූ ද මාස දොළහකට නොවැඩි වූ ද) | 200.00 |
| (ඒ) මෝටර් කෝච් රථය/ සැහැල්ලු මෝටර් කෝච් රථය/ බර මෝටර් කෝච් රථය (මාස හයකට වැඩි වූ ද මාස දොළහට නොවැඩි වූ ද) | 500.00 |
| (ඔ) මෝටර් ලොරිය/ සැහැල්ලු මෝටර් ලොරිය/ බර මෝටර් ලොරිය (මාස හයකට වැඩි වූ ද මාස දොළහකට නොවැඩි වූ ද) | 500.00 |
| (ඕ) වෙනත් වාහන (මාස හයකට වැඩි වූ ද මාස දොළහකට නොවැඩි වූ ද) | 250.00 |
| 14. තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් නිකුත් කිරීම | 5,000.00 |
| 15. 1 ශ්‍රී 0001 ලියාපදිංචි අංක පෙළ හඳුන්වා දීමට පෙර ලියාපදිංචි කර තිබූ මෝටර් වාහන සඳහා විශේෂ වාහන සඳහා වූ විශේෂිත අංක පෙළ යටතේ අදාළ දත්ත පරිගණකගත කිරීමෙන් පසු, ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම | 10,000.00 |

EOG 11-0124

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.